# මිත්‍රත්වය පිළිබඳ බුදුදහමේ ඉගැන්වීම්

මෙලොව ජීවත් වන කාලයෙහි ඤාතීන්, අසල්වැසියන්, හිතවතුන් ආදීන් සමඟ සුහදශීලීව ජීවත් වීම මිත්‍රත්වය නමින් හැඳින්වේ. පාලි භාෂාවෙහි 'මිත්ත' යනුවෙන් ද සංස්කෘතයෙහි 'මිත්‍ර' නමින් ද සිංහලයෙහි 'මිතුරු' නමින් ද ඉංග්‍රීසියෙහි Friendship නමින් ද මෙය භාවිත වේ. මිතුරුකම, යහළුකම ආදි නම් මේ සඳහා සිංහල භාෂාවෙහි ව්‍යවහාර කෙරේ. අප තනිව ඉපදුණ ද තනිව මිය ගිය ද ජීවත් වන්නේ සමාජයක් තුළයි. එහි දී අපට බොහෝ දෙනා මුණ ගැසෙන අතර බොහෝ දෙනා සමඟ එකට කටයුතු කිරීමට ද සිදු වේ. එහි දී ඔවුනොවුන් සමඟ සුහදව මිත්‍රශීලීව ක්‍රියා කිරීම දෛනික ජීවිතයේ කටයුතු පහසුවෙන් හා සාර්ථකව කර ගැනීමට උපකාරී වේ. යහපත් මිත්‍රත්වය මෙලොව සාර්ථකත්වය සඳහා පමණක් නොව පරලොව සුගතිගාමී වීමට ද සසරින් මිදීමට ද උපකාරී වේ. මිත්‍රත්වය පිළිබඳව බුදුදහමෙහි විවිධ තැන්හි කරුණු සඳහන් වන අතර එය සරලව මෙන් ම ගැඹුරින් ද සාකච්ඡාවට භාජනය වී ඇති බව පෙළ දහම විමසීමේ දී පෙනී යයි.

**මිත්‍රත්වය හා මෛත්‍රිය:**

මිත්‍රත්‍වය (Friendship) හා මෛත්‍රිය (Loving Kindness) යන පද දෙක ඉතා ළඟින් කියැවෙන පද දෙකකි. එබැවින් බොහෝ දෙනාගේ අදහස මේ දෙකම සමාන බවයි. එහෙත් පාලි භාෂාව මෙන් ම බුදුදහමේ ඇතුළු කරුණු විමසීමෙන් පෙනී යන්නේ මේ දෙකෙහි වෙනසක් පවත්නා බවයි. මිත්‍රත්‍වය (පාලි, මිත්ත) යන්නෙහි අදහස මිතුරුබව යන්නයි. මෛත්‍රිය (පාලි. මෙත්තා/ සිංහල. මෙත්) යන්නෙහි අරුත මෛත්‍රී සහගත බව (මෙත්සිත)යි. මේ දෙකෙහි සමාන ලක්ෂණ පැවැතිය ද මෙහි පැහැදිලි වෙනසක් පවතී. මිතුරු බව සඳහා සක්‍රිය ලෙස දෙපාර්ශ්වයක් සිටිය යුතු අතර මෛත්‍රී වැඩීමට එලෙස අවශ්‍ය නොවේ. බුදුදහමෙහි මිත්තානිසංස වෙනමත් මෙත්තානිසංස වෙනමත් පැහැදිලි කොට තිබීමෙන් මෙය වඩාත් ප්‍රකට වේ. මිත්‍රත්‍වය සීමිත පිරිසකට සීමා වන අතර මෛත්‍රිය අප්‍රමාණ සත්ත්වයන් කෙරෙහි පැතිරිය හැක්කකි. මිත්‍රත්‍වය ඇති තැනැත්තා තුළ ද කිසියම් ආකාරයක මෛත්‍රියක් පවතින නමුදු එය තමා හඳුනාගත් පිරිසකට පමණක් සීමා වේ. මෛත්‍රී වඩන්නා තුළ තමා ඇසුරු කරන හා නොකරන, පෙනෙන නොපෙනෙන සැමට එකසේ පවත්නා පුළුල් සිතිවිලි පවතී. මෛත්‍රිය සතර බ්‍රහ්ම විහරණ අතර එක් භාවනා කමටහනකි. එය කරුණාව, මුදිතාව, උපේක්ෂාව කරා ද විහිදී යන්නකි.

සජීවී පුද්ගලයන් පිළිබඳව මිත්‍රත්වය ක්‍රියාත්මක වීමේ දී අවම වශයෙන් දෙපාර්ශ්වයක් ඊට සම්බන්ධ වේ. එක් පාර්ශ්වයක ක්‍රියාකාරීත්වය අනෙක් පාර්ශ්වයට හිතකර අයුරින් මෙන් ම අහිතකර ආකාරයෙන් ද බලපානු දක ගත හැකි ය. මෙහි දී අප විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ දෙපාර්ශ්වයට ම යහපත සිදුවන අයුරින් මිත්‍රත්වය කෙසේ කළමනාකරණය කර ගත යුතු ද, එය දියුණු කර ගත යුතු ද යන්න පිළිබඳව බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් කරුණු සාකච්ඡා කිරීමටයි. මෙහි දී විශේෂයෙන් තමා කේන්ද්‍ර කර ගනිමින් කරුණු සාකච්ඡා කෙරේ. යමෙකු සමඟ කටයුතු කිරීමේ දී තම පෞද්ගලික ආරක්ෂාව සලසා ගන්නා ගමන් තම සමීපතමයන්ගේ ද ආරක්ෂාව රැක ගනිමින් තම මිතුරන්ට ද උපකාර කරමින් ඔවුන් වෙතින් ද කිසියම් ප්‍රතිලාභයක් ගත හැකි නම් මිත්‍රත්වයෙන් ගත හැකි ඵලය එයයි. බුදුදහමින් මේ සඳහා උපදෙස් බොහොමයක් අපට ලබා ගත හැකිය.

**මිතුරන්ගේ ප්‍රභේද:**

සිගාලෝවාද සූත්‍රයෙහි මිතුරන් පිළිබඳව විස්තරාත්මකව කරුණු සඳහන් වේ. එහිදී මිතුරන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වා තිබේ. එනම් මිත්‍රප්‍රතිරූපක හා සුහදමිත්‍ර වශයෙනි. මිත්‍ර ප්‍රතිරූපක යනු මිතුරන් ලෙස පෙනී සිටින එහෙත් සැබෑ මිතුරන් නොවන අයයි. සුහද මිතුරන් යනු යහපත් ආකල්පවලින් යුතු හොඳ හදවත් ඇති ගුණවත් මිතුරන් ය. මෙහි දී පළමුව මිත්‍ර ප්‍රතිරූපයන්ගේ ස්වභාවය විස්තර කෙරේ.

මිතුරන් සේ පෙනී සිටින එහෙත් අවංක මිතුරන් නොවන (මිත්‍ර ප්‍රතිරූපක) පුද්ගලයන් සිව් දෙනෙකි. එනම්,

1. අඤ්ඤදත්ථුහර (මිතුරා සතු දෑ රැගෙන යන)
2. වචීපරම (වචනයෙන් පමණක් උපකාර කරන)
3. අනුප්පියභාණී (චාටුබස් කතා කරන)
4. අපායසහාය (අපාගත වීමට සහාය වන)

1). අඤ්ඤදත්ථුහර නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. කෙසේ හෝ යමක් රැගෙන යයි.
2. ටිකක් දී බොහෝ දෑ ගෙන යාමට කැමැති වෙයි.
3. තමාට බියක් විපතක් ඇති කල්හි ඇසුරු කරයි.
4. තම වාසිය සඳහා ඇසුරු කෙරෙයි.

*අඤ්ඤදත්ථුහරො හොති අප්පෙන බහුමිච්ඡති,*
*භයස්ස කිච්චං කරොති සෙවති අත්ථකාරණා.*
*අඤ්ඤදත්ථුහරො හොති අප්පෙන බහුමිච්ඡති,*
*භයස්ස කිච්චං කරොති සෙවති අත්ථකාරණා.*

2). වචීපරම නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. අතීතයෙන් සංග්‍රහ කරයි (*අතීතෙන පටිසන්ථරති*).
2. අනාගතයෙන් සංග්‍රහ කරයි (*අනාගතෙන පටිසන්ථරති*).
3. නිරර්ථක හෙවත් හිස් දෙයින් සංග්‍රහ කරයි (*නිරත්ථකෙන සඞ්ගණ්හාති*).
4. කටයුත්තක් පැමිණි කල්හි එහි බිය දකියි (*පච්චුප්පන්නෙසු කිච්චෙසු බ්‍යාසනං දස්සෙති*).

වැඩකට නැති වචනයෙන් පමණක් සංග්‍රහ කරන වචීපරම මිතුරා මෙලෙස දත යුතුය.

3). අනුප්පියභාණී නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. හොඳ දෙය ද අනුමත කරයි (*පාපකම්පි'ස්ස අනුජානාති*).
2. නරක දෙය ද අනුමත කරයි (*කල්‍යාණම්පි'ස්ස අනුජානාති*).
3. ඇති තැන ගුණ කියයි (*සම්මුඛා'ස්ස වණ්ණං භාසති*).
4. නැති තැන දෙස් කියයි (*පරම්මුඛා'ස්ස අවණ්ණං භාසති*).

4). අපායසහාය නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. රහමෙර පානයෙහි සහාය වෙයි (*සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ සහායො හොති*).
2. නොකල්හි වීථි සංචරණයෙහි සහාය වෙයි (*විකාලවිසිඛාචරියානුයොගෙ සහායො හොති*).
3. නෘත්‍ය දර්ශනයෙහි සහාය වෙයි (*සමජ්ජාභිචරණෙ සහායො හොති*).
4. දූ කෙළියෙහි සහාය වෙයි (*ජූතප්පමාදට්ඨානානුයොගෙ සහායො හොති*).

මිතුරු වෙසින් පෙනී සිටින මෙබඳු අමිත්‍රයන් උවදුරු සහිත බිය ගෙන දෙන මාර්ගයක් සේ සලකා දුරින් ම බැහැර කළ යුතු ය.

*අඤ්ඤදත්ථුහරො මිත්තො යො ච මිත්තො වචීපරො,*

*අනුප්පියඤ්ච යො ආහ අපායෙසු ච යො සඛා.*

*එතෙ අමිත්තේ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො,*

*ආරකා පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා'ති.*

පාපමිත්‍රයන්ගේ ලක්ෂණ දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ එබඳු පාප මිතුරන් දුරින් ම දුරු කළ යුතු බව දක්වා තිබේ. ඊට හේතුව ඔවුන් නිසා මහත් අනර්ථයක් සිදුවීමයි. ඔවුන් දුරු කළ යුත්තේ භෞතික වශයෙන් නොව ඔවුන්ගේ දුර්ගුණයන් ය. අපට හැකිනම් ඔවුන්ට කල්‍යාණ මිත්‍රත්වයෙන් පිහිට වී ඔවුන් ද සුමගට ගැනීම බෙහෙවින් වැදගත් වනු ඇත.

පාප මිතුරන් ඇසුරු කිරීමෙන් ලැබෙන ආදීනව පිළිබඳව ද සිගාලෝවාද සූත්‍රයෙහි වැඩි දුරටත් විස්තර වේ. පාපමිත්‍ර ඇසුරෙහි ආදීනව 6 කි. එනම්,

1. සූදුකාරයන් තම ඇසුරට පැමිණීම (*යෙ ධුත්තා ත්‍යාස්ස මිත්තා හොන්ති*)
2. සල්ලාලයන් තම ඇසුරට පැමිණීම (*යෙ සොණ්ඩා*)
3. බේබද්දන් තම ඇසුරට පැමිණීම (*යෙ පිපාසා*)
4. බොරු රන් ආදිය දී රවටන්නන් (නෙකතිකයන්) තම ඇසුරට පැමිණීම (*යෙ නෙකතිකා*)
5. වංචනිකයන් තම ඇසුරට පැමිණීම (*යෙ වඤ්චනිකා*)
6. සාහසිකයන් තම ඇසුරට පැමිණීම (*යෙ සාහසිකා*)

මෙලෙස ඇසුරු නොකළ යුතු මිතුරන් පෙන්වා දෙන සිගාලෝවාද සූත්‍රය ඉන්පසු ඇසුරු කළ යුතු කලණ ගුණ පිරි සුහද මිතුරන් හඳුන්වා දෙයි.

හොඳ හදවත් ඇති (සුහද) ඇසුරු කළ යුතු යහපත් / කලණ මිතුරන් සිව් දෙනෙකි. එනම්,

1. උපකාරක මිතුරා
2. සමානසුඛදුක්ඛ මිතුරා
3. අත්ථක්ඛායී මිතුරා
4. අනුකම්පක මිතුරා

1). උපකාරක මිතුරාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. ප්‍රමාද වූවන් රකියි (*පමත්තං රක්ඛති*).
2. ප්‍රමාද වූ මිතුරාගේ වස්තුව රකියි (*පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති*).
3. බියට පත්වූවන්ට පිහිට වෙයි (*භීතස්ස සරණං හොති*).
4. කටයුතු උපන් කල වැඩියෙන් ධනය දෙයි (*උප්පන්නෙ කිච්චකරණීයෙ තද්දිගුණං භොගං අනුප්පදෙති*).

2). සමානසුඛදුක්ඛ මිතුරාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. රහස් කියයි (*ගුය්හමස්ස ආචික්ඛති*).
2. රහස් රකියි (*ගුය්හමස්ස පරිගුහති*).
3. විපතෙහි අත් නොහරියි (*ආපදාසු න විජහති*).
4. කරුණක් ඇති කල්හි ජීවිත වුව ද පුදයි (*ජීවිතම්පි'ස්ස අත්ථාය පරිච්චත්තං හොති*).

3). අත්ථක්ඛායී මිතුරාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. පවින් වළකයි (*පාපා නිවාරෙති*).
2. යහපතෙහි පිහිටුවයි (*කල්‍යාණෙ නිවෙසෙති*).

3. නොදත් දේ කියයි (*අස්සුතං සාවෙති*).
4. සුගතියට මග කියා දෙයි (*සග්ගස්ස මග්ගං ආචික්ඛති*).

4). අනුකම්පක මිතුරාගේ ලක්ෂණ 4 කි. එනම්,

1. තම මිතුරාගේ පිරිහීමෙහි දී සතුටු නොවෙයි (*අභවෙනස්ස න නන්දති*).
2. තම මිතුරාගේ අභිවෘද්ධියෙහි දී සතුටු වෙයි (*භවෙනස්ස නන්දති*).
3. තම මිතුරා පිළිබඳ දෙස් කියන්නවුන් ඉන් වළකයි (*අවණ්ණං භණමානං නිවාරෙති*).
4. තම මිතුරා පිළිබඳ ගුණ කියන්නවුන් පසසයි (*වණ්ණං භණමානං පසංසති*).

හොඳ හදවත් ඇති තමාට යහපත සිදුකරන මෙබඳු සුහද මිතුරන් මව තම පුතුන් ළෙහි ද රකින්නාක් මෙන් සත්කාර කොට ඇසුරු කළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කරති.

*'උපකාරො ච යො මිත්තො යො ච මිත්තො සුඛෙ දුඛෙ,*
*අත්ථක්ඛායී ච යො මිත්තො යො ච මිත්තො'නුකම්පිකො.*
*එතෙ පි මිත්තෙ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො,*
*සක්කච්චං පයිරුපාසෙයය්‍ය මාතා පුත්තං'ව ඔරසං'*

අපි බොහෝ විට අන් අය වෙතින් යහපත් ගුණාංග අප වෙත ලැබීමට කැමැත්තෙන් සිටිමු. එහෙත් වඩාත් වැදගත් වන්නේ බාහිරින් හොඳ මිතුරන් ලැබීමට ප්‍රථම තමා අන් අයට සුහද මිතුරකු වීමයි. එවිට තමාගේ ගුණයන්ට සමාන බොහෝ මිතුරන් අපට මුණ ගැසෙනු ඇත. අප තුළ ඇත්තේ අල්ප ගුණ නම් අපට මුණ ගැසෙන්නේ ද එබඳු ම මිතුරන් ය. අප තුළ ඉහළ ගුණාංග ඇති විට එබඳු ඉහළ ගුණාංග සහිත සුහද මිතුරන් අපට මුණ ගැසේ. ආලවක සූත්‍රයෙහි (සං.නි.) දැක්වෙන පරිදි **'මිතුරන් දිනා ගන්නේ කෙසේ ද?'** (කථං මිත්තානි ගන්ථති?) යනුවෙන් විමසූ පැණයට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ **'දන් දෙන්නා මිතුරන්ගේ සිත් දිනා ගන්නා'** (දදං මිත්තානි ගන්ථති) බවයි. එබැවින් සමාජගත ජීවිතයේ දී අන් අයගේ සිත් දිනා ගත හැකි මූලික ගුණාංගයක් වන්නේ පරිත්‍යාගශීලී බවයි. මෙහිදී තමා දන්දෙන දෙය අන් අයගේ අභිවෘද්ධිය යහපත සඳහා හේතු වන්නක් විය යුතු ය. ඒ සඳහා අප බුද්ධිමත් විය යුතු ය. එසේ නොවුණ හොත් එක් අතකින් අපට පාප මිත්‍රයන් මුණ ගැසෙන අතර අනෙක් අතින් සුහද මිතුරන් අහිමි වීමට ද හේතු වනු ඇත. තමා සන්තක දේ අන් අයගේ අවශ්‍යතා අනුව අනුග්‍රාහක බුද්ධියෙන් හෝ අන් අයගේ ගුණ සලකා පූජා බුද්ධියෙන් හෝ පරිත්‍යාග කිරීම අන් අයගේ ප්‍රශංසාවට මෙන් ම යහපත් මිතුරන් මුණ ගැසීමට ද ඉවහල් වන්නකි. විශේෂයෙන් සංසරත්නය වෙනුවෙන් යමක් පූජා කිරීමෙන් ධර්මශ්‍රවණයට ද අවස්ථාව උදා වේ. මෙය දනයෙන් ලැබෙන උසස් ප්‍රතිඵලයකි. තම මිතුරන් වෙනුවෙන් ද දිය හැකි උසස් ම දනය නම් ධර්ම දනයයි. එය මිතුරන්ගේ දෙලොවට යහපත උදාකර දෙයි. ධර්ම ශ්‍රවණය කළ පමණට මිතුරන් සත්පුරුෂයන් වන අතර එවිට ඔවුන් සුමිතුරන් බවට පත් වේ.

දනය මෙන් ම සීලය ද මිතුරන් දිනා ගත හැකි කරුණකි. යමෙකු සිල්වත් ව වෙසෙයි ද ඔහුට සමාජයේ ඕනෑම පිරිසක් වෙත විශාරදව නිර්භයව යා හැකි බව දක්වා තිබේ. එමගින් තම මිතුරන්ගේ මෙන් තමා ඇසුරු කරන හැමගේ විශ්වාසය, ගෞරවය මෙන් ම ප්‍රසාදය දිනා ගැනීමට ද හැකිවේ. විශේෂයෙන් ආකංඛෙය්‍ය සූත්‍රයෙහි දැක්වෙන පරිදි සිලවත් ජීවිතයක් ගත කිරීම මෙලොව ජීවත් වන ඤාති මිත්‍රාදීන්ට මෙන් ම මියගිය ඤාතීන්ට ද ආනිසංසදයී බව දක්වා තිබේ. එබැවින් මහලු වන තුරුම සිල්වත්වීම උතුම් බව සඳහන් වේ (*සීලං යාව ජරා සාධු*). ඒ අතර අවංකබව, කළගුණ දන්නාබව, මෛත්‍රීසහගත බව යනාදි ගුණාංග මිත්‍රත්වය දිගුකලක් පවත්වා ගැනීමට උපකාරී වේ.

යහපත් මිතුරකු තුළ තිබිය යුතු ගුණාංග සහ එම ගුණාංගයන්ට ලැබෙන ආනිසංස පිළිබඳව ජාතක පාලියෙහි මූගපක්ඛ ජාතකයෙහි විස්තර සහිතව කරුණු සඳහන් වේ. එහි ගාථා දහයකින් විශේෂයෙන් මේ පිළිබඳ කරුණු පැහැදිලි කෙරේ.

*පහූතභක්ඛෝ භවති විප්පවුත්තෝ සකාසරා, බහූ නං උපජීවන්ති යෝ මිත්තානං න දූභති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහී නොවේ නම්, ඔහු තම නිවසින් බැහැර ගියේ නමුදු
බොහෝ ආහාරපාන ලබයි. බොහෝ දෙනෙක් ඔහුව ඇසුරු කරති.

*යං යං ජනපදං යාති නිගමෙ රාජධානියො, සබ්බත්‍ථ පූජිතෝහෝති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, යම් ජනපදයකට නියම්ගමකට, හෝ රාජධානියකට ගියේ, ඒ හැම තැනදී ම ඔහු පුදනු ලබන්නෙක් වෙයි. අන් අයගේ ගෞරව සම්මානයට පාත්‍ර වෙයි.

*නාස්ස චෝරා පසහන්ති නාතිමඤ්ඤෙති ඛත්තියෝ, සබ්බේ අමිත්තේ තරතී යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, සොරු ඔහුට හිරිහැර නොකරයි. රජතෙමේ ඔහු ඉක්මවා නොසිතයි. ඔහු නොමිතුරන් ඉක්මවන්නෙක් වෙයි.

*අක්කුද්ධො සඝරං එති සභාය පටිනන්දිතෝ, ඤාතීනං උත්තමෝ හෝති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, බැහැරට ගිය ඔහු නොකිපී සිය නිවසට පැමිණෙයි. සභාවෙහි දී සතුටු වෙයි. ඤාතීන්ට උතුමෙක් වෙයි.

*සක්කත්‍වා සක්කතෝ හෝති ගරු හෝති සගාරවෝ, වණ්ණකිත්තිභතෝ හෝති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, ඔහු අන් අයට සත්කාර කොට තමා ද සත්කාර ලබන්නෙක් වෙයි. අන් අයට ගරු කොට තමා ද ගෞරව ලබන්නෙක් වෙයි. ඔහුගේ කීර්තිය හැමතැන පැතිරෙයි.

*පූජකෝ ලභතේ පූජං වන්දකෝ පටිවන්දනං, යසෝ කිත්තිඤ්ච පප්පෝති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, ඔහු අන් අයට පූජා කරන්නේ තමා ද පූජා ලබන්නෙක් වෙයි. අන් අයට වඳින්නේ තමා ද වන්දනා ලබන්නෙක් වෙයි. පිරිවර හා කීර්තිය ලබන්නෙක් වෙයි.

*අග්ගි යථා පජ්ජලති දේවතා'ව විරෝචති, සිරියා අජහිතෝ හෝති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, ඔහු ගින්න මෙන් දිලිසෙයි. දෙවියකු මෙන් බබලයි. සෞභාග්‍යයෙන් නොපිරිහේ.

*ගාවෝ තස්ස පජායන්ති ඛෙත්තේ වුත්තං විරූහති, වුත්තානං ඵලමස්නාති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, ඔහුට ගවයන් බොහෝ වෙති. කුඹුරෙහි අස්වැන්න වැඩිවේ. එම ධාන්‍යයන්ගේ අස්වැන්න මැනැවින් අනුභව කරයි.

*දරිතෝ පබ්බතාතෝ වා රුක්ඛාතෝ පතිතෝ නරෝ, චුතෝ පතිට්ඨං ලභති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, ඔහු ගුහාවකින් හෝ පර්වතයකින් හෝ ගසකින් හෝ වැටුණේ නමුදු පිහිටක් ලබයි. අනතුරක් නොවේ.

*විරූළ්හමූලසන්තානං නිග්‍රෝධමි'ව මාලුතෝ, අමිත්තා නප්පසහන්ති යෝ මිත්තානං න දූහති.*

යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි නම්, හොඳින් මුල්බැසගත් නුගගසක් සුළඟින් නොසෙල්විය හැක්කාක් මෙන් සතුරන්ට ඔහුව නොමැඩිය හැකි වේ.

## නිවසෙහි දී හොඳම මිතුරා

දෙමාපියන් සමඟ නිවසෙහි වෙසෙන තැනැත්තාට තම නිවසෙහි දී මුණ ගැසෙන හොඳම මිතුරා වන්නේ තම මවයි (*මාතා මිත්තං සකාසරේ*). නැතහොත් තම පියායි. දරුවන් හදවඩා පෝෂණය කොට සියලු ගුණදහම් කියා දී පාපයෙන් මුදවා යහපතෙහි යොදවන්නේ අපගේ දෙමාපියන් ය. එබැවින් අපට මුලින් ම මුණු ගැසෙන හොඳම මිතුරන් වන්නේ අපගේ දෙමාපියන් ය.

යමෙකු යුග දිවියට පත් වූ පසු ලැබෙන මිතුරා වන්නේ තමාගේ බිරිඳයි (*භරියා'ව පරමා සඛා*). එසේ නැතහොත් තම ස්වාමි පුරුෂයායි. එබැවින් විවාහ වීමෙන් පසු ඔවුනොවුන් අවංකව කරුණාවෙන් පරිත්‍යාගශීලීව ක්‍රියා කරමින් ඔවුනොවුන්ට සුහද මිතුරන් වීමට උත්සාහවත් වීම වැදගත් වේ.

බුදුදහමෙහි වඩාත් අගය කරන්නේ මෙලොව පරලොව නිවන පිළිබඳ දහම් මග දන්නා මිතුරන්ගේ ආශ්‍රයයි. එනම් කල්‍යාණමිත්‍ර ආශ්‍රයයි. මක් නිසාද යත් යමෙක් අපට මුළු ජීවිත කාලය තුළ ම සැලකුව ද අනන්ත සසරට සාපේක්ෂව එය ඉතා සුළු උපකාරයක් පමණක් වන බැවිනි. වරෙක ආනන්ද මාහිමියන් වහන්සේ සඳහන් කළේ මෙම සම්බුදු සසුනෙහි ශාසන බ්‍රහ්මචර්යාවෙන් භාගයක් ම පවතින්නේ කල්‍යාණ මිත්‍රත්වය මත ය කියායි. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ දේශනා කළේ භාගයක් නොව සම්පූර්ණ ශාසන බ්‍රහ්මචර්යාව ම රඳා පවත්නේ කල්‍යාණ මිත්‍රත්වය මත බවයි.

## යහපත් ගිහි මිතුරා

ගෘහස්ථ ජීවිතයේ දී අපට හමුවන යහපත් මිතුරකු තුළ තිබිය යුතු ගුණාංග 7ක් පිළිබඳව සඳහන් වේ. අංගුත්තර නිකායෙහි සත්තක නිපාතයෙහි (අං.නි.4, 330 පිට) මිත්ත සූත්‍රයට අනුව සුහද මිතුරකු තුළ තිබිය යුතු එම ලක්ෂණ නම්,

1. දීමට අපහසු දෑ දෙයි (*දුද්දදං දදති*).
2. කිරීමට අපහසු දෑ කරයි (*දුක්කරං කරොති*).
3. ඉවසීමට අපහසු දේ පවා ඉවසයි (*දුක්ඛමං ඛමති*).
4. තමාගේ රහස් තම මිතුරාට හෙළි කරයි (*ගුය්හමස්ස ආවිකරොති*).
5. තම මිතුරාගේ රහස් රකියි (*ගුය්හං අස්ස පරිගුහති*).
6. ආපදාවන්හි දී තම මිතුරා අත්නොහරී (*ආපදාසු න ජහති*).
7. ධනය හානි වූ විට නැතිහොත් දුප්පත් බව හේතුවෙන් තම මිතරාට අවමන් නොකරයි (*ඛීණේන නාතිමඤ්ඤති*).

## කලණ පැවිදි මිතුරා

කලණ මිතුරකු වශයෙන් භික්ෂුවක් තුළ තිබිය යුතු ලක්ෂණ මොනවාද යන්න භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කරති. භික්ඛු මිත්ත සූත්‍රයේ (අං.නි.4, 330 පිට) සඳහන් වන පරිදි පැවිදි මිතුරකු තිබිය යුතු ගුණාංග හතකි. ඒවා නම්,

1. ප්‍රිය වූවෙක් (පියෝ ච) ද මනාප වූවෙක් (*මනාපෝ ච*) ද වෙයි.
2. ගරු කළ යුත්තෙක් නැතහොත් ගුරුවරයෙක් ද වෙයි (*ගරු ච*)
3. බුහුමනට/ ගෞරවයට සුදුස්සෙක් වෙයි (*භාවනීයෝ ච*).
4. කතා කිරීමට සුදුස්සෙක් වෙයි (*වත්තා ච*).
5. ඇදහිය හැකි (විශ්වාස කළ හැකි) වචන ඇත්තෙක් වෙයි (*වචනක්ඛමෝ ච*).
6. ගැඹුරු (අර්ථවත්) වචන ඇත්තෙක් වෙයි (*ගම්භීරඤ්ච කථං කත්තා*).
7. අස්ථානයෙහි (නොමගෙහි) නොයොදවයි (*නො ච අට්ඨානෙ නියෝජයෝ*).

## බොදු පැතුම

සැම පින්කමක් අවසවානයේ දී ම බෞද්ධයන් ප්‍රාර්ථනා කරන සුවිශේෂී පැතුම වන්නේ ද යහපත් මිතුරන්ගේ අසුරයි.

*'ඉමිනා පුඤ්ඤකම්මේන මා මේ බාලසමාගමෝ,*
*සතං සමාගමෝ හෝතු යාව නිබ්බාන පත්තියා'.*

මේ පිනෙහි ආනිසංසයෙන් නිවන් දක්නා තුරු මට අනුවණ අසත්පුරුෂ බාලයන්ගේ ඇසුරක් නොම වේවා. සත්පුරුෂ මිතුරන්ගේ ම ඇසුර ලැබේවා.

අංගුත්තර නිකායේ දසක නිපාතයේ අවිද්‍යා සූත්‍රයෙහි දක්වෙන පරිදි අවිද්‍යාවට පත්ව සසර දුක් විඳීමට මෙන් ම අවිද්‍යාව දුරු කොට විමුක්තියට පත්වීමට ද බලපාන ප්‍රධාන සාධකය වන්නේ මිත්‍රත්‍වයයි. මෙහි දී ප්‍රථමයෙන් අවිද්‍යාවට බලපාන ආසන්නතම හේතු මෙන් ම ඊට බලපාන මූල හේතුන් ද විස්තර කර තිබෙනු දක්නට ලැබේ. මෙහිදී භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අවිද්‍යාවට බලපාන හේතු එකිනෙක විස්තර කරති. ඒ අනුව,

1. අවිද්‍යාවට හේතුව පංච නීවරණයි.
2. පංචනීවරණවලට හේතුව ත්‍රිවිධ දුශ්චරිතයයි.
3. ත්‍රිවිධ දුශ්චරිතයට හේතුව ඉන්ද්‍රිය අසංවරයයි.
4. ඉන්ද්‍රිය අසංවරයට හේතු ව අසති අසම්පජඤ්ඤයයි.
5. අසති අසම්පජඤ්ඤයට හේතුව අයෝනිසොමනසිකාරයයි.
6. අයෝනිසෝමනසිකාරයට හේතුව අශ්‍රද්ධාවයි.
7. අශ්‍රද්ධාවට හේතුව අසද්ධර්මශ්‍රවණයයි.
8. අසද්ධර්මශ්‍රවණයට හේතුව අසත්පුරුෂ ආශ්‍රයයි.

අවිද්‍යාවට පවත්නා ආසන්නතම හේතුව පංචනීවරණ බවත් ඊට බලපාන මූල හේතුව අසත්පුරුෂ ආශ්‍රය තුළින් අසද්ධර්ම ශ්‍රවණය බවත් මෙහිදී විස්තර කෙරේ.

ඉන්පසු අවිද්‍යාව සහිත ඉහත හේතු සියල්ල දුරු කිරීමේ මග ද අවිද්‍යා සූත්‍රයෙහි ම සඳහන් කර ඇත. දුක් දුරුකරලීමෙන් ලබන ඉහළ ම තත්ත්වය වන්නේ විද්‍යාමුක්තිය සාක්ෂාත් කර ගැනීමයි. විද්‍යා විමුක්තිය සාක්ෂාත් කර ගැනීමට බලපාන හේතු සාධක අනුපිළිවෙළින් අවිද්‍යා සූත්‍රයෙහි තවදුරටත් විස්තර වේ. ඒ අනුව,

1. විද්‍යාවිමුක්ති සාධනයට හේතුව සත්තබොජඣංගයයි.
2. සත්තබොජ්ඣංගයට හේතුව සතර සතිපට්ඨානයයි.
3. සතර සතිපට්ඨානයට හේතුව ත්‍රිවිධ සුචරිතයයි.
4. ත්‍රිවිධ සුචරිතයට හේතුව ඉන්ද්‍රිය සංවරයයි.
5. ඉන්ද්‍රිය සංවරයට හේතුව  සතිසම්පජඤ්ඤයයි.
6. සතිසම්පජඤ්ඤයට හේතුව යෝනිසෝමනසිකාරයයි.
7. යෝනිසෝමනසිකාරයට හේතුව ශ්‍රද්ධාවයි.
8. ශ්‍රද්ධාවට හේතුව සද්ධර්මශ්‍රවණයයි.
9. සද්ධර්මශ්‍රවණයට හේතුව සත්පුරුෂ ආශ්‍රයයි.

අවිද්‍යා සූත්‍රයේ එන ඉහත විස්තරයෙන් මනාව පැහැදිලි වන්නේ ප්‍රඥව ලබා ගැනීමට කල්‍යාණ සත්පුරුෂ ආශ්‍රය බෙහෙවින් වැදගත් බවයි. පඤ්ඤාවුඩ්ඪි සූත්‍රයෙහි දක්වෙන පරිදි ප්‍රඥව වැඩීමට හේතුවන කරුණු අතර කල්‍යාණ මිත්‍ර ආශ්‍රය මූලික කරුණක් වශයෙන් දක්වා තිබේ. සතර සෝතාපත්ති අංග යටතේ ද මුල් අංගය වශයෙන් දක්වා ඇත්තේ මෙම කරුණමයි. කල්‍යාණමිත්‍ර ආශ්‍රය ආධ්‍යාත්මික ගමන් මගෙහි ප්‍රධාන අංගයක් ලෙස දක්වා ඇත්තේ එබැවිනි. තවද කල්‍යාණමිත්‍ර ආශ්‍රය ලැබෙන විට සීලාදී ගුණදහම් පුරා සේඛ ධර්ම වඩා රූපරාග, අරූපරාගයන්ගෙන් මිදී සසරින් මිදීමට අවකාශ සැලසෙන බව මිත්ත සූත්‍රෙයහි වැඩි දුරටත්

දක්වා තිබේ. පාපමිත්‍ර ආශ්‍රයෙන් මේ සියල්ල වැළකී යයි (අං.නි.4, 218-220 පිටු). ඒ අනුව කල්‍යාණමිත්‍ර ආශ්‍රයෙන් හැකිතාක් දුරට පටිච්චසමුප්පාදය පාදක කොටගත් අනිත්‍යතාව ප්‍රකට කෙරෙන ධර්මය නිරන්තරයෙන් ශ්‍රවණය කිරීම බෙහෙවින් වැදගත් වේ. අවිද්‍යාව සපුරා දුරුකොට දුකින් නිදහස්වනු සඳහා ඇසූ ධර්මය නුවණින් මෙනෙහි කිරීමත් එම ධර්මය අනුව ත්‍රිවිධ ශික්ෂාවෙහි හැසිරීමත් අනිවාර්යයෙන් කළ යුතුව ඇත.

බුදුදහමින් මග පෙන්වන්නේ මිත්‍රත්වය කල්‍යාණ මිත්‍රත්වයක් බවට පත් කරගෙන සැබෑ පිළිසරණ/ ආරක්ෂාව / කල්‍යාණ මිත්‍රත්වය තමා තුළ ම උපදවා ගැනීමටයි. ඊට හේතුව බාහිර කොතරම් කල්‍යාණ මිත්‍රයන් සිටිය ද අවසානයෙහි තමා හුදකලා වන බැවිනි. එබැවින් තමාට නියම රැකවරණය වන්නේ තමාගේ සිත ම නැතහොත් ශ්‍රී සද්ධර්මය ම පිහිටක් කර ගැනීමයි. ඒ සඳහා භාග්‍යවතුන් වහන්සේ තම ශ්‍රාවකයන් බෙහෙවින් උනන්දු කරවා තිබේ.

*අත්තදීපා භික්ඛවේ විහරථ අත්තසරණා, න අඤ්ඤසරණා*

*ධම්මදීපා භික්ඛවේ විහරථ ධම්මසරණා න අඤ්ඤසරණා*

තමාට තමා පහනක් / දිවයිනක් සරණක් කර ගන්න, වෙනත් සරණක් නොමැත.

ධර්මය තමාට පහනක් / දිවයිනක් සරණක් කර ගන්න, වෙනත් සරණක් නොමැත.

## තෙරුවන් සරණයි!

## සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

## පැසදිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරය

# ධර්මචාරිකා වැඩසටහන

## (බු.ව. 2561 ඉල්) 11/18/2017

## දායකත්වය :-

දෙන් ධර්මසේන මහත්මා සහ දූදරුවන්

## අරමුණ :-

පින්වත් දෙන් ධර්මසේන මහත්මාට මහත් සේ උපකාර කළ සුහද මිතුරන් දෙදෙනකු වන ප්‍රින්ස් ගුණසේකර මහතා, තිසේරා හෙට්ටිආරච්චි මහතා යන දෙදෙනාගේ ගුණ සිහිකිරීම මෙම පින්කමේ විශේෂ අරමුණකි. මේ උතුම් පුණ්‍ය කර්මයෙහි ආනිසංසයෙන් එම දෙදෙනාගේ සසර ජීවිත සුවපත් ව පරම සුවය වෙත සමීප වීමට වාසනාව උදාවේවා.